ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.02.10 චක්‍රලේඛ අංක : 07/2026

දිසා කොමසාරිස්වරුන් වෙත,

<u>2026 වසර සඳහා අධිකාරී පත්‍ර නවීකරණය</u>

1. 2026 වසරට නවීකරණය කිරීම සඳහා සියළුම අධිකාරී පත්‍ර 2026 පෙබරවාරි මස 28 වන දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයට යොමු කළ යුතු ය.

2. නව සමූහයන් ලියාපදිංචි කිරීම සඳහා FORM/ GRAF/07/2026 අයදුම්පත සම්පූර්ණ කර එවන්න.

3. සෑම සමූහයක් සඳහා ම සමූහ බාලදක්ෂ නායකයකු (GSL) පත් කර ගැනීමට කටයුතු කරන්න.

   පාසලක නම් විදුහල්පති ද , ආයතනයක නම් ආයතන ප්‍රධානියා ද මේ සඳහා තෝරා ගන්න. (විදුහල්පති හෝ ආයතන ප්‍රධානියා නොවන අවස්ථාවක, නම් කරන පුද්ගලයා පිළිබඳව කැමැත්ත ප්‍රකාශිත විදුහල්පති තුමාගේ /ආයතන ප්‍රධානියාගේ ලිපියක් ඉල්ලුම් පත්‍රය සමග යොමු කළ යුතු ය. ) මේ සඳහා FORM/ WAF/03/2026 ඉල්ලුම් පත්‍රය යොදා ගන්න.

4. නව බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම්පත් (FORM/ WAF/01/2026) එවීමේ දී

<u>අදාල සමූහයේ ලියාපදිංචි අංකය</u> අනිවාර්යයෙන්ම <u>සඳහන් කරන්න.</u>

<u>ජාතික බාලදක්ෂ මූලස්ථානයෙන් **2026 වර්ෂයට නිකුත් කරන ලද ඉල්ලුම් පත්‍ර මගින් පමණක් යොමු කළ යුතු ය.**</u>

අදාල ඉල්ලුම් පත්‍රයෙහි ඔබගේ සමූහය නම් කිරිමේ දී දිස්ත්‍රික්කය විසින් ලබා දී ඇති සමූහ අංකය ඉදිරියේ සමූහයේ නම ලිවිය යුතු ය. සමූහ අංකය යෙදීම අනිවාර්ය වේ.

උදාහරණ - 10 වන කොළඹ - ආනන්ද විද්‍යාලය

තනතුරු වෙනස් කිරීමක් හෝ සේවා ස්ථානය වෙනස් කිරීමක් හෝ සිදු කරන්නේ නම් 2026 වර්ෂය සඳහා ජාතික බාලදක්ෂ මූලස්ථානය මගින් නිකුත් කරණ ලද අදාල බලපත්‍ර ඉල්ලුම් පත්‍රයක් (FORM/ WAF/01/2026) , (FORM/ WAF/02/2026) හෝ (FORM/ WAF/04/2026) සම්පූර්ණ කර අනිවාර්යයෙන්ම <u>කලින් ලබා ගත් අධිකාරී පත්‍රය ද</u> සමග ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු ය.

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Tel : + 94 112 433131 /+94 112 433512
FAX : + 94 112 433131
E -mail : slsaheadq@gmail.com
web : www.scout.lk

**5.** අධිකාරී පත්‍ර නවීකරණය සඳහා එවීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.

- ❖ ලබා දී ඇති අධිකාරී පත්‍ර වල පසු පිට අත්සන යොදා නිසි ලෙස සම්පූර්ණ කර ඇත්දැයි බලන්න.

- ❖ නවීකරණය සඳහා ඉදිරිපත් කරනු ලබන සිගිති/පෝතක/බාලදක්ෂ/මානවක නායකයින්/නායිකාවන්ගේ අධිකාරී පත්‍ර සමග ඔවුන් දැනට සමූහ මට්ටමේ බාලදක්ෂ කටයුතු වල නියැලෙන බවට 2026 වර්ෂය සඳහා මූලස්ථානයෙන් නිකුත් කර ඇති **<u>FORM/W.R.F./06/2026</u>** පෝරමය අනිවාර්යෙන් ම සමූහ බාලදක්ෂ නායක /විදුහල්පති සහතික කර දිසා කොමසාරිස්තුමාගේ අනුමැතිය සහිතව සම්පූර්ණ කර එවිය යුතුය.

- ❖ දිස්ත්‍රික් නායකයින්ගේ හා සහාය දිසා කොමසාරිස්වරුන්ගේ අධිකාරී පත්‍ර සමග ඔවුන් දැනට දිස්ත්‍රික් මට්ටම් වගකීම් දරමින් බාලදක්ෂ කටයුතු වල නියැලෙන බවට 2026 වර්ෂය සඳහා ජාතික මූලස්ථානය මගින් නිකුත් කර ඇති **<u>FORM/W.R.F./05/2026</u>** පෝරමය අනිවාර්යෙන් ම දිසා කොමසාරිස් සහතික කොට එවිය යුතු ය.

6. අදාළ පෝරම කට්ටල මේ සමග ඇත ( වර්ග 07 කි.)

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

***සම්පත්කාරියවසම්***
***සහාය ප්‍රධාන කොමසාරිස් (කළමණාකරණ හා මූල්‍ය)***

***නීතිඥ මනෝජ් නානායක්කාර***
***ප්‍රධාන කොමසාරිස්***

පිටපත් : 1. මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්,
2. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික